# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2007 අංක 39 දරන සරණ බෞද්ධ (සහන) පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 සැප්තැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2007 අංක 39 දරන සරණ බෞද්ධ (සහන) පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 28 වන දින]

එල්. ඩී. ඕ. අයි. එන්. සී 11/2004

### සරණ බෞද්ධ (සහන) පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"සරණ බෞද්ධ (සහන) පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් නාකුළුගමුවේ සුමන ස්ථවිරයන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව බුද්ධ ධර්මයේ ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීම සහ එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එකී පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට පවත්වාගෙන ගොස් ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් හා එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 39 දරන සරණ බෞද්ධ (සහන) පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සරණ බෞද්ධ (සහන) පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් "සරණ බෞද්ධ (සහන) පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය. සරණ බෞද්ධ (සහන) පදනම සංස්ථාගත කිරීම.

2—PL 001530—2,800 (2006/10)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව, සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මහජන යහපතට හේතු වන සංස්කෘතික, සමාජ, ආර්ථික සහ ආගමික සංවර්ධනය වැඩි දියුණු කිරීම ;

(ආ) බුද්ධ ධර්මය අධ්‍යයනය කිරීමට සහ පර්යේෂණ කිරීමට අනුග්‍රහය දැක්වීම හෝ කරගෙන යාමට සහ බුද්ධ ධර්මයේ ඉගැන්වීම් පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචාරය කිරීම ;

(ඇ) රැක බලා ගත යුතු ගිලන්, මහලු, වයෝවෘද්ධ හෝ දිළිඳු භික්ෂූන්ට මෙන්ම, පොදු මහජනතාවට ද අවශ්‍ය වන පරිදි සත්කාර කිරීම, ආධාර සහ උපකාර කිරීම ;

(ඈ) පහසුකම් අඩු ප්‍රදේශවල සිටින වරප්‍රසාද අඩු ළමයින්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කර ගැනීමට සහ දක්ෂතාවන් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා ආධාර උපකාර කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, දේශීය හා විදේශීය වශයෙන් ප්‍රදාන සහ පරිත්‍යාග සහ ත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනයේ යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් පහ කිරීම, විනයානුකූල කටයුතු කිරීම ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීතිවලට යටත්ව, එම රීතිවල විධිවිධාන සළස්වා ඇති ධුර දරන්නන් සංඛ්‍යාවකින් සමන්විත වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද, කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ විධායක කමිටුවේ සාමාජිකයන් වශයෙන් සිටියා වූ තැනැත්තන්ගෙන්

සංයුක්ත විය යුතු අතර, එම ප්‍රථම කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ නව කළමනාකරණ මණ්ඩලය තෝරා පත් කර ගන්නා තුරු දිගටම ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම, හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලයේ ධුර දරන්නන් ද, සංස්ථාවේ වෙනත් නිලධරයන්, අනුයෝජිතයන් හා සේවකයන්ගේ කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදන ලද රීති එවැනිම මහ සභා රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ගිණුම් හා විගණනය.

**7**. (1) සංස්ථාවට ලැබෙන සියලු ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරනු ලබන සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට කළමනාකරණ මණ්ඩලය විසින් කටයුතු සැළැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් හෝ පරීක්ෂා කොට, විගණනය කළ යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් —

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ යම් තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද ගණකාධිකාරී ආයතනයක්

අදහස් වේ.

පදනම විසින් ගෙවිය යුතු ණය හා පදනමට අයවිය යුතු ණය.

8. මේ පනතේ කාර්යයන් සඳහා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබෙන සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතු වන කවර වුවද චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා ශක්‍යතාව තිබිය යුතු අතර, එබඳු සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යන වග.

10. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි යම් තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඒ තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයෙහි අත්සන් තැබිය යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබීමට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

11. සංස්ථාව ගණන් බේරා වසා දැමීමේ දී හෝ විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ඒ දේපළ සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**12**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තන්මේතුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.